# 1

SINHALI
GREAT QUESTIONS

ලෝකයට සිදුවෙගෙන යන්නේ කුමක්ද?

ICI UNIVERSITY
LIBRARY





පිළිබඳ

# ප්‍රධාන ප්‍රශ්න

# දැයාබර මිතුර

ඔබ සමහර විට මෙසේ සිතනවා ඇත. ''ජීවිතය යනු කුමක්ද? මා බිහිවූයේ මන්ද? ප්‍රීතිය උදාකර ගන්නේ කෙසේද?'' එසේ නම් මෙම තැපැල් මාර්ගික පාඩම් මාලාවේ පාඩම් හය ඔබට ඉමහත් ප්‍රයෝජනවත් වනවා ඇත. මෙම පාඩම් හය නම්:

ලෝකයට සිදුවීගෙන යන්නේ කුමක්ද?
දෙවියන්වහන්සේ පිළිබඳ සත්‍යය කුමක්ද?
ජීවිතය යනු කුමක්ද?
ඔබේ වැදගත්ම අවශ්‍යතාවය සපුරා ගන්නේ කෙසේද?
මරණින් පසු සිදුවන්නේ කුමක්ද?
සැබෑ ක්‍රිස්තියානි සභාව යනු කුමක්ද?

පළමු පාඩම පමණක්ම ප්‍රමාණවත් එකක් වන අතර පය අනිකුත් පාඩම් වලට හැඳින්වීමක් හැටියටද ක්‍රියා කරයි. මෙම පාඩම් සෑම පුද්ගලයෙකු විසින්ම ජීවිතය ගැන නගන්නාවූ වැදගත් ප්‍රශ්න වලට පිළිතුරු සපයයි.

ඔබ මෙම පාඩම සම්පූර්ණ කළ පසු මෙහි එකොලොස් වන පිටුවෙහි වෙන්කර ඇති තීරයේ ඔබේ නම සහ ලිපිනය ලියන්න. ඉන් පසුව පසු පිටුවෙහි සඳහන් ලිපිනයට මෙම පොත් පිංච තැපැල් කර එවන්න.

ඔබේ පාඩම් ශ්‍රේණිගතකර දෙවන පාඩම සමග ආපසු ඔබ වෙත ලැබෙන්ට සලස්වනවා ඇත. තවද ඔබට ත්‍යාගයක් ලෙස පොත් පිංචක් ලැබෙයි. මෙම පාඩම් මාලාවට අළුත් ශිෂ්‍යයෙකු වශයෙන් අපි ඔබව පිළිගන්නේ මේ ආකාරයෙනි.

ඔබට සිතෙනවා විය හැකිවාක් මෙන්ම ජීවිතය පිළිබඳ වැදගත් ප්‍රශ්නයන්ට පිළිතුරු සොයා ගැනීමට ඔබ විසින් සෑහෙන උත්සාහයක් දැරිය යුතුවනු ඇත. කෙසේ නමුත් මෙම පාඩම් ඉතා පහසුවෙන් තේරුම් ගත හැකි සිත් ගන්නා ඒවා බව ඔබට පෙනී යනු ඇත.

ඔබෙන් පුද්ගලිකව ලිපි ලබාගැනීමට අපි කැමැත්තෙමු. මෙම පාඩම් මාලාව හදාරණ අවස්ථාවේදී ඔබේ සිතට හැඟෙන කුමන ප්‍රශ්ණයක් හෝ වේවා අප වෙත ඉදිරිපත් කරන්න. අපි නිතරම ඔබෙන් තොරතුරු ලබා ගැනීමට කැමැත්තෙමු.

අන්තර් ජාතික තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනයේ ප්‍රීතිමත් පවුලට අපි ඔබව සාදරයෙන් පිළිගනිමු.

-අධ්‍යක්ෂක

© 1983 All Rights Reserved
International Correspondence Institute
Brussels Belgium
D/1983/2145/77

## 1 වැනි පාඩම

# ලෝකයට සිදුවීගෙන යන්නේ කුමක්ද?

ඔබ මෙම පාඩමෙන් ඉගෙන ගන්නා දේවල් නම්:

- ▲ ඔබ සත්‍ය කෙසේ දැනගන්නෙහිද?
- ▲ ලෝකය ආරම්භවූයේ කෙලෙසද?
- ▲ ලෝකයට සිදුවූ වරද කුමක්ද?
- ▲ ලෝකයට කිසියම් බලාපොරොත්තුවක් තිබේද?

පළමුවැනි කොටස

## ඔබ සත්‍ය කෙසේ දැනගන්නෙහිද?

### විද්‍යාව, ඉතිහාසය සහ නිරීක්ෂණය

විද්‍යාව ඉතිහාසය, නිරීක්ෂණය කරණකොටගෙන සියළු මනුෂ්‍යයන් ඇතුළුව ලෝකය පිළිබඳ බොහෝ පුදුම දේවල් ඔබට උගෙනීමට පුළුවන. නමුත් මෙම මාර්ගවලින් ජීවිතයේ වැදගත් ප්‍රශ්න බොහෝමයකට පිළිතුරු ඔබට උගත නොහැක. ජීවිතය ආරම්භ වූයේ කෙලෙසද, එහි අරමුණකුමක්ද? අනාගතය කෙවැනිද? යනු ඒවා අපට ප්‍රකාශ නොකරයි.

### බයිබලය

ලෝකය මැව් තැනන්වහන්සේට පමණී එය සෑදුවේ කෙසේද? මන්ද? යන්න ඔබට කියා දිය හැකි වන්නේ. ශුද්ධවූ බයිබලය නැමැති උන්වහන්සේගේ පොත තුළින් මේ දේවල් පිළිබඳ සත්‍යයන් උන්වහන්සේ අපට කියාදෙන සේක. එය මෙලොව ජීවත්වීමට උපදේශ පොතකි.

### මෙම පාඩම්මාලාව – ජීවිතය පිළිබඳ වැදගත් ප්‍රශ්න

මෙම පාඩම් සකසා ඇත්තේ බයිබලය පදනම් කරගෙනය. ඔබේ ප්‍රශ්නවලට පිළිතුරු සපයන බොහෝ බයිබල් පද-වලින් සමහරක් මෙම පාඩම්වලට ඇතුළත්කර ඇත. උපුටා



ගන්නා ලද එක් එක් කොටසට පෙරාතුව යොද ඇති යොමු කිරීමෙන් දක්වෙන්නේ ඒවා බයිබලයේ කුමණ පොතේ, කුමණ පරිච්ඡේදයේ, පදයේ සඳහන්ව ඇත්තේද යන්නයි.

බයිබලය මුලින්ම ලියන ලද භාෂාවෙන් හැර තවත් භාෂා බොහොමයකට පරිවර්තනය කර ඇත. සිංහලෙන් ද මුද්‍රණ කීපයක් ඇත. අප මෙම පාඩම් සඳහා අවශ්‍ය පාඨ උපුටා ගන්නා ලද්දේ 1910 ප්‍රකාශිත බයිබල් සමාගමේ පිටපත හා 1919 බැප්ටිස්ට මිෂනාරි සමාගම ප්‍රකාශිත පිටපත හා සසඳා සම්පාදිත ප්‍රතිසංස්කෘත පිටපතින් හා ජීවමාන බයිබලයෙනි. අර්ථය පැහැදිලි කරලීම සඳහා සමහර පාඨ අප විසින් වෙනස් කර ඇත.

## දෙවැනි කොටස

# ලෝකය ආරම්භවූයේ කෙලෙසද?

### එය ඉබේ ඇති වූවක්ද ?

ලෝකය කොතැනින් පැමුණුනේද ? එය ඉබේ ඇතිවූවක්ද ? ශ්‍රේෂ්ඨ මනසකින් එය සැලසුම් කරන ලදද ? ශ්‍රේෂ්ඨ බලයක් මගින් එය සාදන ලදද ? ඔබ යම් විටෙක ඔබෙන්ම අසා ගන්නවාද ?

බයිසිකලයක්, මෝටර් රථයක්, අහස්යානයක් දුටුවිට එය ඉබේ ඇතිවිය නොහැකි බව ඔබ දනී. ඒවා ස්ථිර නීති මාලාවක් මත ක්‍රියාත්මක වන ලෙස යම් කිසිවෙකු විසින් සැළසුම් කොට සාදන ලද ඒවාය.

### ලෝකය සාදන ලද්දේ සැලැස්මක් අනුවය

ලෝකයත් එහි ඇති සියල්ලත් අපි ස්වභාව ධර්මයේ නීති යනුවෙන් ව්‍යවහාර කරන ස්ථිර රටාවක් අනුව ක්‍රියාත්මක වේ. මෙම නීති පිළිබඳ කරුණු විද්‍යාව මගින් වැඩි වශයෙන් සොයා ගන්නා විට මෙම විශ්වයේ සෑම දෙයක්ම යම් තැනැත්තෙකු විසින් සැළසුම්කර ඔහුගේ සැලැස්මට අනුව එය ක්‍රියාත්මක වන්නට සළසා ඇති බව අපට වඩ වඩා තහවුරු වේ. ඒ තැනන්වහන්සේ නම් සියලු බලය ඇත්තාවූ සියලු ඥාණය ඇත්තාවූ මැවුම්කාර දෙවියන්වහන්සේය. උන්වහන්සේ විශ්වයේ ස්වාමීන් වහන්සේ හෙවත් ආණ්ඩුකාරයාණෝය.

**මෙය කටපාඩම් කරන්න**

**උත්පත්ති 1:1** පටන් ගැන්මේදි දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක.

**යොහන් 1:3** උන්වහන්සේ කරණකොටගෙන සියල්ල සාදන ලද්දේය.



## දෙවියන් වහන්සේ සර්වසම්පූර්ණ ලෝකයක් මැවූ සේක.

දෙවියන්වහන්සේ ඉර, සඳ තරු සහ පොළොව මැවූසේක. උන්වහන්සේ ඒවා එකිනෙක නොගැටෙන පිණිස ස්ථිර ගමන් මාර්ගවල පිහිටෙවූ සේක. වඩාත් කිට්ටුවීමෙන් නොපිලිස්සෙන පිණිසත් වඩා ඈත්වීමෙන් අප අධික ශීතලකට ගොදුරු නොවන පිණිසත් උන්වහන්සේ සූර්යයාගෙන් පොළොව පිහිටිය යුතු නියමිත දුර ප්‍රමාණය නියම කළසේක. ගොඩබිමත් සාගරයත් නිසි ප්‍රමාණයෙන් සම්පූර්ණ විය. වායුගෝලයද නිසියාකාරවම විය. ඉන් පසුව දෙවියන් වහන්සේ ජීවමාන දේවල් සෑදූසේක. අන්තිමේදී උන්වහන් සේ ශෝභමානවූ අපූර්ව ලොවෙහි මනුෂ්‍යයා සිටවූසේක.



මෙය කටපාඩම් කරන්න.

**උත්පත්ති 1:31** දෙවියන්වහන්සේ තමන් සෑදූ සියල්ල දුටුසේක. ඒ ඉතා යහපත්ව තිබුණේය.

## දෙවියන් වහන්සේ ලෝකය සෑදුවේ මන්ද?

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ ප්‍රීතිය සඳහා ලෝකය සෑදූසේක. දෙවියන්වහන්සේ තමන්වහන්සේ විසින් ප්‍රේම කරනු ලබන්නාවූද, ඔවුන්ගේ ප්‍රීතිය විඳින්නාවූද උන් වහන්සේගේ දරුවන් වන පිණිස මනුෂ්‍ය පවුල මැවූසේක. ඔවුන්ගේ වාසස්ථානය සඳහා පොළව මැවූසේක. දෙවියන් වහන්සේ විශ්වයේ අලංකාරයෙන් හා පිලිවෙලිනුත් ප්‍රීතිමත් වන අතර වඩාත්ම ප්‍රසන්න වන්නේ උන්වහන්සේගේ දරුවන්ගේ ප්‍රේමයෙන්ය.



**එළිදරව් 4:11** මක්නිසාද ඔබ සියලු දේ මැවූසේක. ඔබගේ කැමැත්ත නිසා ඒවා තිබුණේය. ඒවා මවන ලද්දේ යයි කියති.

**ගීතාවලිය 149:4** මක්නිසාද ස්වාමීන් වහන්සේ තමන් සෙනඟ කෙරෙහි ප්‍රසන්න වනසේක.

උන්වහන්සේගේ දරුවන් තමන්වහන්සේ මෙන් වීමටත් උන්වහන්සේගේ වැඩවලට පංගුකාරයන් වීමටත් දෙවියන් වහන්සේට උවමනා කළ සේක. එමනිසා දෙවියන්වහන්සේ ප්‍රථම මනුෂ්‍යයා සහ ස්ත්‍රියවූ ආදම් සහ ඒව ට තමන්වහන් සේගේ ස්වභාවයට බොහෝ ආකාරයෙන් සමානවූ ස්වභාව යක් දුන්සේක. දෙවියන් වහන්සේ ඔවුන්ට උගන්වන සේක. උන්වහන්සේගේ උපකාරය ඇතිව මනුෂ්‍ය වර්ගයා පොළව ආණ්ඩු කරනවා ඇත.



**උත්පත්ති 1:26** තවද දෙවියන්වහන්සේ අපගේ ස්වරූපයෙන් මනුෂ්‍යයා සාදම්හ, ඔවුහු මුළු පොළව කෙරෙහි ආණ්ඩු කෙරෙත්වයි කී සේක.

### ඔබේ අභ්‍යාසය සඳහා

★ හිස්තැන් පුරවන්න.

★ ලෝකය සෑදුවේ කෙසේද? කුමක් සඳහාද? යන්න අපට කියන්නේ කිනම් පොතද?....................

★ ස්වභාව ධර්මයේ නීතියැයි අප නම් කරන ජීවිතයේ රටාවන් පිහිටුවන ලද්දේ කවුද?......................

★ කවරෙකුගේ ප්‍රීතිය සඳහා ලෝකය මවන ලද්දේද? ..........................................

★ ලෝකය යහපත්වීද? අයහපත්වීද? ..................

★ පළමු මිනිසාගේ සහ ස්ත්‍රියගේ නම සඳහන් කරන්න. ......................සහ.......................

★ මනුෂ්‍ය පවුල උන්වහන්සේගේ ප්‍රේමය බුක්තිවිඳීමටත් උන්වහන්සේගේ .........................වීමත් උන්වහන්සේට උවමනා කළ සේක.

★ ..........................ආධාර ඇතිව මනුෂ්‍ය වර්ගයාට.................... ආණ්ඩු කිරීමට තිබුණි.

## තුන්වැනි කොටස

# ලෝකයට සිදුවූ වරද කුමක්ද?

### යමකිසි වරදක් සිදුවිය

අවට බලන්න. එවිට ඔබට දුක වේදනාව, ශෝකය, අඬදබර, සැහැසිකම, යුද්ධ සාගින්න සහ මරණය පෙනෙනවා ඇත. ලෝකය දැන් සර්ව සම්පූර්ණ නැත. සිදුවූ වරද කුමක්ද? වරක් සම්පූර්ණව තිබූ මේ ලෝකය දෙවියන්වහන්සේගේ සතුරකු සහ මනුෂ්‍යයා විසින් නරක් කර තිබේ.

### දෙවියන්වහන්සේගේ සතුරා

සාතන් හෙවත් යක්ෂයා නම්වූ බලසම්පන්න සතුරෙක් දෙවියන්වහන්සේට සිටී. දෙවියන්වහන්සේගේ සෑම දෙයකටම සාතන් විරුද්ධවේ. දෙවියන්වහන්සේ යහපත් වන සේක. සාතන් අයහපත් දෙයින් යහපත් දේ සමඟ සටන් කරයි. දෙවියන්වහන්සේ අපට උපකාර කිරීමට බලා සිටින සේක. සාතන් අපව විනාශකිරීමට තැත් කරයි. මනුෂ්‍යයාගේ ප්‍රේමයත් සහභාගිකමත් බුක්තිවිඳීම දෙවියන්වහන්සේට අවශ්‍යය. යක්ෂයා අපව දෙවියන්වහන්සේගෙන් වෙන් කිරීමට උත්සාහ කරයි. අප විසින් දෙවියන්වහන්සේ අනුගමනය නොකර ඒ වෙනුවට තමන් අනුගමනය කරවන්නට සාතන් උත්සාහ කරයි.

## මනුෂ්‍යයාගේ පාපය

සාතන් ආදම් සහ ඒවට දෙවියන්වහන්සේ පිළිබඳව බොරු කීවේය. ඔහු ඔවුන්ව පාපයට එනම් දෙවියන්වහන්සේට අකීකරු වීමට පොළඹවා ගත්තේය. පාපය මරණය ගෙන දෙන බව දෙවියන්වහන්සේ ආදම්ට කියා තිබුසේක. මක්නිසාද පාපය කෙනෙකුව දෙවියන් වහන්සේගෙන් වෙන් කරන හෙයිනි. ජීවනය පැමිණෙන්නේ දෙවියන්වහන්සේ ගෙන්ය. ඒ නිසා උන්වහන්සේගෙන් වෙන්වීමෙහි අවසානය මරණයයි. ආදම් සහ ඒව දෙවියන්වහන්සේව විශ්වාස නොකර සාතන්ව විශ්වාස කිරීමට තෝරාගත්හ. ඔව්හු දෙවියන් වහන්සේගේ අණ කඩකර තමන්ගේ මාර්ගවල ගියහ. එහි ප්‍රතිඵලය වූයේ ලෝකය දුක්මුසු තත්වයකට පත් වීමයි.

## පාපයෙහි විපාක

පාපය ලෝකයට රෝග සහ මරණය ගෙනාවේය.



රෝම 5:12 එක් මනුෂ්‍යයෙක් කරණකොටගෙන පාපයත්, පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුළු වූවාක් මෙන්ම සියළු මනුෂ්‍යයන් පව්කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමුණුනේය.

පාපය දෙවියන්වහන්සේත් මනුෂ්‍යයාත් අතර සම්බන්ධතාවය කඩා තිබේ. මනුෂ්‍යයා කැරලිකාරව, අකීකරුව, පාපිෂ්ඨව සිටිනතාක් ඔහුට දෙවියන්වහන්සේ සමඟ සහභාගිකම් පැවැත්විය නොහැක. ඔහු දෙවියන්වහන්සේගේ දරුවෙක් නොව පාපයේ දසයෙක්ය.



රෝම 6:16 නුඹලා කීකරුකම පිණිස දසයන් කොට යමකට නුඹලාම භාරදෙන්නහුද එය මරණයට පමුණුවන්නාවූ පාපය වේවා, ධර්මිෂ්ඨකමට පමුණුවන්නාවූ කීකරුකම වේවා නුඹලා කීකරු වන එකට දසයන් වන බව නො දනිව්ද?

අපි දෙවියන්වහන්සේට අකීකරුවන්නට තෝරාගැනීමෙන් සාතන්ගේ විජ්ලවයට බැඳී ඔහුගේ ආණ්ඩුව පිළිගන්නෙමු. පොළව දෙවියන්වහන්සේගේ සහ සාතන්ගේ රණබිම බවට පත්ව තිබේ. ඔබ මින් කුමන පැත්තකට සිටිය යුතුද යන්න ඔබ විසින් තෝරාගත යුතුය.

## ඔබේ තෝරාගැනීම—දෙවියන්වහන්සේගේ මාර්ගයද සාතන්ගේ මාර්ගයද



**යොෂුවා 24:15** නුඹලා සේවය කරන්ට කැමති කාටද කියා අද්ම තෝරා ගනිල්ලා. එහෙත් අපි නම් මමද, මාගේ පවුලද ස්වාමීන්වහන්සේට සේවය කරමු යයි කීවේය.

| දෙවියන්වහන්සේ අපට පිළිගන්වන්නේ | සාතන් අපට පිළිගන්වන්නේ |
|---|---|
| **ස්වභාවධර්මය තුළ** | |
| සම්පූර්ණ මැවිල්ලක්<br>පිළිවෙල,<br>සමබර ලක්ෂණ<br>සම්පාදනයෙහි බහුලත්වය | ස්වභාවධර්මයේ විකෘතිය,<br>අපිළිවෙල, ව්‍යාකූලත්වය,<br>අවලක්ෂණ<br>දිළිඳුකම, සාගින්න,<br>විසංගතය |
| **අපේ ශරීරයතුළ** | |
| යහපත් ආශාවන්<br>ජීවනය හා නිරෝගිකම | කෑදරකම, දුසිරිත තෘෂ්ණාව<br>රෝගය සහ මරණය |
| **අපේ සිතුවිලි හැඟීම් සහ ක්‍රියාකාරිත්වයන්** | |
| සත්‍යය, ඇදහිල්ල, ශ්‍රද්ධාව | අසත්‍යය, අවිශ්වාසය,<br>මෝඩකම |
| යහපත් සිතුවිලි<br>අරමුණක් නිර්මාණය කිරීම | අයහපත් සිතුවිලි<br>අරමුණක් නැතිකම,<br>විනාශකිරීම |
| නිර්මල ප්‍රේමය<br>නිසැකකම, විශ්වාසය<br>යටහත්කම, කීකරුකම<br>තෝරාගැනීමේ නිදහස<br>සමාදනය, ප්‍රීතිය<br>උපකාරවන්තකම, යුක්තිය<br>දෙවියන්වහන්සේ සමඟ සහභාගිකම | ආත්මාර්ථය, වෛරය<br>බිය, සැක<br>උඩඟුව, කැරලිකාරකම<br>පාපයට වහල්වීම<br>දබර, ශෝකය<br>අපරාධය, අයුක්තිය<br>දෙවියන්වහන්සේගෙන් වෙන්වීම |

**ඔබේ අභ්‍යාසය සඳහා**

ඉහත සඳහන් සටහනෙන් ඔබට අවශ්‍ය යැම දෙයක්ම ඉදිරියෙන් කතිර ලකුණ (X) ද ඔබට අනවශ්‍ය දේ ඉදිරියෙහි බින්දුව (0) ද යොදන්න. ඔබ ලකුණුකළ අන්දමට ඔබ වඩා කැමති කුමන පැත්තේ සිටීමටද දෙවියන්වහන්සේගේද? සාතන්ගේද?....................

## සතර වැනි කොටස
# ලෝකයට කිසියම් බලාපොරොත්තුවක් තිබේද?

**දෙවියන්වහන්සේ ලෝකය අත්හැර දමා නැත.**

අප පාපිෂ්ඨයන්ව සිටියත් දෙවියන්වහන්සේ අපට ප්‍රේම කරන සේක. අපව පාපයෙන් සාතන්ගෙන් සහ සදාකාලික මරණයෙන් ගළවා ගැනීමට දෙවියන්වහන්සේ මාර්ගයක් සද තිබෙන සේක. දෙවියන්වහන්සේ තවමත් විශ්වය පාලනය කරන අතර නැවතත් පොළව කීකරුකමට පමුණුවන සේක.

## දෙවියන්වහන්සේගේ පුත්‍රයා අපේ දඬුවම විඳදරා ගත්සේක.

මිහිපිට සිටින සෑම පුද්ගලයෙකු විසින්ම පව්කර ඇති හෙයින් මරණ දඬුවම නියමවී ඇත. අප ගළවා ගන්නා පිණිස අපටම මාර්ගයක් නොතිබිණි. දෙවියන්වහන්සේ අපට ප්‍රේම කරන හෙයින් අපේ දඬුවම ගන්නා පිණිස තමන් වහන්සේගේ පුත්‍රවූ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ එවූ සේක.

අවුරුදු 2000 පමණ පෙර පලස්තීනය නම් රටේ කන්‍යාවක තුලින් දෙවියන්වහන්සේගේ ආශ්චර්යවත් බලයෙන් යේසුස් වහන්සේ මෙලොවට බිහිවූසේක. එතුමා දෙවියන්වහන්සේ හා උන්වහන්සේගේ ප්‍රේමය ගැන සත්‍යය මනුෂ්‍යයාට ඉගැන්වූ සේක. උන්වහන්සේ තම මුළු ජීවිතයටම කිසිම වරදක් නොකළත් අපරාධකාරයෙකු මෙන් කුරුසිය මත ඇණගසා මරණයට පත්කරනු ලැබූ සේක. උන්වහන්සේ අපේ පව් උදෙසා අපේ ස්ථානය ගෙන අප වෙනුවට මළ සේක.

දින තුනකට පසුව මරණයෙන් නැවත නැඟිටවීමෙන් යේසුස් වහන්සේ තම පුත්‍රයාණන් බව දෙවියන්වහන්සේ ලෝකයට පෙන්වූසේක. දින 40 කට පසු යේසුස් වහන්සේ ශාරීරික ලෙස ආපසු ස්වර්ගයට ගියසේක.

මළවුන්ගෙන් නැඟුට්ටාවූ යේසුස්වහන්සේවද, උන් වහන්සේ ස්වර්ගයට ඔසවා ගනු ලබනවාද දුටු උන්වහන්සේගේ මිත්‍රයෝ ඒ ගැන ශුභාරංචිය මගින් අපට කියූහ.

## යේසුස්වහන්සේ පිළිගැනීම අප දේවදරුවන් කරනු ලබයි.

යේසුස්වහන්සේ අපේ දඬුවම ගත්නිසා උන්වහන්සේ තම ගැළවුම්කාරයාණන් බව පිළිගන්නාවූ අය සාතන්ගේ බලයෙන් මිදෙන්නෝය. අපේ පව්වලින් අප ඉවත්වූ විට දෙවියන්වහන්සේ අප උන්වහන්සේගේ දරුවන් කරගන්නා සේක. උන්වහන්සේගේ පුත්‍රයාණන් කෙරෙහි විශ්වාස කරන ලෙසත් අපේ පව්වලින් මිදෙන ලෙසත් දෙවියන් වහන්සේ අපගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින සේක. උන්වහන්සේ එසේ කිරීමට බල නොකරන සේක.

**රෝම 5:17** මක්නිසාද ආදම්ගේ වරද නිසා මරණය අපට උරුම වූ නමුත් - ක්‍රිස්තුස්වහන්සේ නිසා දේව කරුණාවද - ධර්මිෂ්ඨකමේ දීමනාවද අධිකව ලබන අය ජීවනයෙහි රජකම් කරන්නෝය.



### මෙය කටපාඩම් කරන්න



**යොහන් 3:16.** මක්නියාද දෙවියන් වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙනතරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කලේ උන්වහන්සේ කෙරෙහි අදහා ගන්නා සෑම දෙනම විනාශ නොවී සදකාල ජීවනය ලබන පිණිසය.

**රෝම 6:23.** මක්නිසාද පාපයේ කුලිය නම් මරණයය. නමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සදකාල ජීවනයයි.

## ඔබට සර්ව සම්පූර්ණ ලෝකයක ජීවත් වීමට පුළුවන.

ඔබ දැන් යේසුස්වහන්සේ පිළිගන්නේ නම් ලෝකය පාපයෙන් මුදා සර්ව සම්පූර්ණ කිරීමට උන්වහන්සේ කවදා හෝ නැවත පැමිණි විට ඔබ සර්ව සම්පූර්ණ ප්‍රීතියෙන් ජීවත් වනවා ඇත. යේසුස්වහන්සේ ඔබේ ගැළවුම්කාරයාණන් බවට පිළිගත් විට දැන්ම ඔබේ ලෝකය මීට වඩා හොඳ තත්වයකට පත්වන්නේය. මක්නිසාද ඔබ මෙයට වඩා යහපත් පුද්ගලයෙකු වන බැවිනි. දෙවියන්වහන්සේගේ දරුවන්ට අයිති ආශිර්වාද අද සිට ඔබට භුක්ති විඳීම ආරම්භ කළ හැක.

### ඔබේ අභ්‍යාසය සඳහා

★ හිස්තැන්වල ඔබේ නම ලියන්න.

★ දෙවියන්වහන්සේ ........................ වන මට බොහෝ ප්‍රේම කළ නිසා, ස්වකීය පුත්‍රයා වන යේසුස් වහන්සේව එව් සේක. ඒ නිසා.................. ............................වන මට දැන් යේසුස් වහන්සේ කෙරෙහි අදහා පාපයෙන් මිදී සදාකාල ජීවනය ලබන්නට පුළුවන.

★ ඔබට මේ අවස්ථාවේදී යේසුස්වහන්සේව ඔබේ ගැළවුම්කාරයාණන් බව පිළිගැනීමට අවශ්‍ය නම් මෙම යාච්ඤාව කියන්න.

### යාච්ඤාව

දෙවියන්වහන්ස, ඔබවහන්සේ මට ප්‍රේම කරමින්, මගේ පව් උදෙසා මිය යන පිණිස ඔබවහන්සේගේ පුත්‍රයාණන් එවූ නිසා ස්තූති වේවා. මම දැන් මගේ ගැළවුම්කාරයාණන් වශයෙන් යේසුස්වහන්සේව පිළි-ගන්නෙමි. මාගේ ජීවිතයේ ඉතිරි කාලය ඔබ වහන්සේගේ පැත්තෙහි ගත කිරීමට කැමැත්තෙමි. මාව ඔබවහන්සේ සතුටුකරන අන්දමේ පුද්ගලයෙකු කළ මැනව.

ප්‍රථම පාඩම සම්පූර්ණ කිරීම ගැන අපි ඉතාමත් සතුටු වෙමු.

ඔබේ මෙම පාඩම් පොත් පිංච අපවෙත ලැබුනු විගස එය ශ්‍රේණිගතකර දෙවන පාඩම සමග ආපසු ඔබ වෙත එවන්නෙමු.

හයවන පාඩම සම්පූර්ණ කළ පසු අපි ඔබට අලංකාර සහතිකයක්ද පිරිනමන්නෙමු.

ඔබට දෙවියන්වහන්සේ ආශිර්වාද කරන සේක්වා !

# ඔබේ මිතුරු මිතුරියන්ගේ නම් සහ ලිපිනයන් අප වෙත එවන්න.

**''ජීවිතය පිළිබඳ වැදගත් ප්‍රශ්න''**

නමැති පාඩම් මාලාවේ ප්‍රථම පාඩම අපි ඔවුන් වෙත යවන්නෙමු.

**පැහැදිලිව ලියන්න.**

1. නම :...............................................................

ලිපිනය :...............................................................

...............................................

---

2. නම :...............................................................

ලිපිනය :...............................................................

...............................................................

---

3. නම : ...............................................................

ලිපිනය :...............................................................

...............................................

---

ඔබේ නම :..........................................ස්ත්‍රී/පුරුෂ

ලිපිනය :..................................................

..................................................

වයස........................දිස්ත්‍රික්කය.......................

පහත සඳහන් ලිපිනයට ලියන්න.

# ජීවිතය පිළිබඳ ප්‍රධාන ප්‍රශ්න

**පාඩම් පෙළ**

1 ලෝකයට සිදුවිගෙන යන්නේ කුමක්ද?
2 දෙවියන් වහන්සේ පිළිබඳ සත්‍යය කුමක්ද?
3 ජීවිතය යනු කුමක්ද?
4 ඔබේ වැදගත්ම අවශ්‍යතාවය සපුරාගන්නේ කෙසේද?
5 මරණින් පසු කුමක් සිදුවේද?
6 සැබෑ ක්‍රිස්තියානි සභාව කුමක්ද?

අපේ ලිපිනය
ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය
තැ. පෙ. 15,
ජා ඇල